752

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

5වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU5552- ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපන තාක්ෂණය**

කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.06.13 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලට සහ II වන කොටසේ ඇති ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## I - වන කොටස

01. "අධ්‍යාපන තාක්ෂණය" යන පදය සුදුසු අර්ථ දැක්වීමක් භාවිත කරමින් පැහැදිලි කරන්න.

02. තාක්ෂණය, ඉගෙනුම ලබන්නෙකුට සහාය වන්නේ කෙසේද? කරුණු පහක් (05) භාවිත කර විස්තර කරන්න.

03. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට තාක්ෂණය සමෝධානය කිරීමේදී ගුරුවරයාගේ වගකීම් පහ (05) කෙටියෙන් සාකච්ඡා කරන්න.

04. "අධ්‍යාපන තාක්ෂණය සහ සන්නිවේදනය අතර සමීප සම්බන්ධතාවයක් ඇත." ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? හේතු පහකින් (05) ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

05. රූප සටහනක් භාවිතයෙන් සන්නිවේදන ක්‍රියාවලිය විස්තර කරන්න.

06. අන්තර්ජාලයෙන් සිසුන්ට ලබා ගත හැකි ප්‍රතිලාභ මොනවාද? කරුණු තුනක් (03) පැහැදිලි කරන්න.

07. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ නව තාක්ෂණය ඇතුලත් කිරීමට උත්සාහ කරන විට ගුරුවරුන් මුහුණ දෙන අභියෝග පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. ඉගැන්වීම් ක්‍රමයක් ලෙස ගැටළු විසඳීමේ ක්‍රමයේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

ලකුණු 05 X 08 =40



19

## II - කොටස

09. I. ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අන්තර්ගත කළ හැකි ඉගැන්වීම් පද්ධති පහක් (05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

II. ඉහත සඳහන් ඉගැන්වීම් පද්ධති දෙකක් (02) උදාහරණ සමඟ විස්තර කරන්න. (ලකුණු 08)

III. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පන්ති කාමරවල කණ්ඩායම් ඉගැන්වීමේ වැදගත්කම විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 07 )

10. I. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඉගැන්වීමේ ක්‍රමවේද යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 05 )

II. රූප සටහනක් සමඟ ඩේල්ගේ අත්දැකීම් කේතුව (Dale's Cone of Experiences) විස්තර කරන්න. (ලකුණු 07 )

III. ඔබ පන්ති කාමරය තුළ උගන්වන විෂය අනුව විවිධ ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කිරීමේ වැදගත්කම විවේචනාත්මකව තක්සේරු කරන්න. (ලකුණු 08 )

11. I. සැබෑ පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඉගැන්වීම් ආධාරක භාවිත කිරීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 10 )

II. ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා ඉගැන්වීම් ආධාරක තෝරා ගැනීමේදී ඔබ සලකා බලන සාධක මොනවාද? අවම වශයෙන් සාධක පහක් (05) උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 10 )

12. I. වර්තමාන ඉගෙනුම් ඉගැන්වීම් සංදර්භය තුළ පහසුකම් සපයන්නෙකු ලෙස ගුරුවරයාගේ භූමිකාවේ වැදගත්කම විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 )

II. පන්ති කාමරය තුළ ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය භාවිත කරන විට ගුරුවරයා මුහුණ දෙන අභියෝග මොනවාද? අවම වශයෙන් අභියෝග පහක් (05) උදාහරණ සමඟ විස්තර කරන්න. (ලකුණු 10)

13. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. පාඩම් සටහනක් සකස් කිරීමේදී සලකා බැලිය යුතු වැදගත් සාධක.

II. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී බහුමාධ්‍ය භාවිත කිරීමේ වැදගත්කම.

III. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගවේශන ක්‍රමය භාවිත කිරීමේ වැදගත්කම.

IV. බහු ශ්‍රේණි ඉගැන්වීම. (10 X 02= ලකුණු 20)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*